" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204. டென்சில் கொப்பேகடுவ மாவத்தை. பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLAB ACCREDITED
ISO/IEC: 17021
QMS-001-01
ISO 9001

Chief Secretary } Telephone 011 - 2092599 / Fax 011 - 2092601 / E mail - chiefsecretary@wpc.gov.lk
General Telephone } 011 - 2093000

| | | | |
|---|---|---|---|
| My No } CSWP/ADM/30-38/FI/01 | You No } | Date } | 2024 .01. ၁၀ |

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.01.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | 2023.12.28<br>රා.ප.චක්‍රලේඛ 3/2020(I) | වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම. |
| 02. | 2023.12.22<br>රා.ප.චක්‍රලේඛ 26/2023 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයන් සඳහා සහනයක් ලබාදීම. |
| 03. | 2023.12.21<br>රා.ප.චක්‍රලේඛ ලිපි 02/2023 | දේපළ ණය ලබාගැනීමට අදාළ තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම. |
| 04. | 2023.12.21<br>රා.ප.චක්‍රලේඛ 23/2023 | ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයින් සඳහා නිවාඩු ලබාදීම. 2023 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර්. |
| 05. | 2023.12.28<br>රා.ප.චක්‍රලේඛ ලිපි 04/2023 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3:9 උපවගන්තියට අදාළ වන දඩුවමක් ඇතුළත් විනය නියෝගයකදී වැටුප් වර්ධක අඩුකිරීම ක්‍රියාත්මක කළ යුතු ආකාරය. |

| | | |
|---|---|---|
| 06. | 2023.12.18<br>රා.ප.චක්‍රලේඛ 24/2023 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී “20.02.01.01” සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2023.12.31 |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2023

මගේ අංකය : EST-5/04/PCY/0035
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.12.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3:9 උප වගන්තියට අදාළ වන දඬුවමක් ඇතුළත් විනය නියෝගයක දී වැටුප් වර්ධක අඩු කිරීම ක්‍රියාත්මක කළ යුතු ආකාරය

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 23:9 උපවගන්තියට අනුව විනය නියෝගයක් මඟින් ලබා දී ඇති දඬුවමක් ක්‍රියාත්මක කළ යුත්තේ නිලධරයා විසින් වරද සිදු කළ දින සිට ය. ඒ අනුව විනය නියෝගයක් මඟින් වැටුප් වර්ධක ප්‍රමාණයක් අඩු කිරීමට තීරණය කර ඇති විටක වරද සිදු කළ දිනය වන විට නිලධරයා ලබාගෙන ඇති වැටුපෙන් විනය නියෝගයේ සඳහන් වැටුප් වර්ධක සංඛ්‍යාවේ අගය අඩු කිරීමෙන් පසුව ලැබෙන වටිනාකමට අදාළ වන වැටුප් පියවරේ එම නිලධරයා වරද කළ දිනට පිහිටුවීම කළ යුතු ය. මෙහි දී අඩු කළ යුතු වැටුප් වර්ධක සංඛ්‍යාව වරද සිදු කළ දිනය වන විට නිලධරයා විසින් උපයාගෙන තිබූ අනුගාමී වැටුප් වර්ධක විය යුතු ය. මේ ආකාරයට අඩු කරන වැටුප් වර්ධක සංඛ්‍යාව නිලධරයාට සම්පූර්ණයෙන් ම අහිමි වන අතර, එය ප්‍රතිසාධනය (Restoration) කළ නොහැකි ය.

02. මේ බව පහත උදාහරණය මඟින් පැහැදිලි කළ හැකි ය.

උදා:- ස්වකීය වැටුප් වර්ධක දිනය අගෝස්තු 01 වන නිලධරයෙකු 2015.08.01 දින වන විට 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(IV)හි MN-2-2006(ඒ) වැටුප් පරිමාණයේ රු. 15,150/-ක සම්පූර්ණ මාසික වැටුප් පියවරක් ලබන්නේ යැයි ද, එම වැටුප් පරිමාණයේ ලබමින් සිටි වැටුප් වර්ධකයේ වටිනාකම රු.145/- යැයි ද, එම නිලධරයා රු.14,715/-ක වැටුපක් ලබමින් සිට 2012.10.15 දින සිදු කළ වරදකට 2015.12.10 දින චෝදනා පත්‍රයක් නිකුත් කර ඇතැයි ද උපකල්පනය කළ විට,

ගෙවා ඇති වැටුප,

2012.08.01 —රා.ප.ච.06/2006(IV)→ රු.14,715/-
2013.08.01 → රු.14,860/-
2014.08.01 → රු.15,005/-
2015.08.01 → රු.15,150/-
} චෝදනා පත්‍රය නිකුත් කර නොමැති බැවින් වැටුප් වර්ධක ගෙවා ඇත

2016.01.01 —රා.ප.ච.03/2016→ රු.18,388/- + රු.9,792/-(ගැලපුම් දීමනාව)
2016.08.01 → රු.18,388/- + රු.9,792/-(ගැලපුම් දීමනාව)
} චෝදනා පත්‍රය නිකුත්ව ඇති බැවින් වැටුප් වර්ධක නතර කර ඇත.

අනතුරුව වැටුප් වර්ධක 05ක් අඩු කිරීමට විනය නියෝගය ලැබී ඇතැයි උපකල්පනය කළ විට, වරද කළ 2012.10.15 දින සිට වැටුප් වර්ධක 05ක් එනම්, 2012, 2011, 2010, 2009 හා 2008 වර්ෂයන් සඳහා අදාළ වැටුප් වර්ධක 05 අඩු කළ යුතු වේ. එවිට වැටුප් සැකසීම පහත පරිදි වේ.

2012.08.01 —රා.ප.ච.06/2006(IV)→ රු.14,715/-

2012.10.15 → රු.13,990/- (වැටුප් වර්ධක 05ක් අඩු කළ පසු)

2013.08.01 → රු.14,135/-

2014.08.01 → රු.14,280/-

2015.08.01 → රු.14,425/-

2016.01.01 —රා.ප.ච.03/2016→ රු.17,508/- + රු.9,831/-(ගැලපුම් දීමනාව)

2016.08.01 → රු.17,684/- + රු.9,822/-(ගැලපුම් දීමනාව)

2012.10.15 දින නිලධරයාගේ වැටුප වැටුප් වර්ධක 05කින් සංඛ්‍යාත්මකව අඩු කිරීම කළ යුතු අතර එදිනට පෙර කාලයට අදාළව කිසිදු මුදලක් නිලධරයාගෙන් අය නොකළ යුතුය. 2012.10.15 (එදින ද ඇතුළත්ව) දිනෙන් පසු වැඩිපුර ගෙවා ඇති මුදල අය කළ යුතු ය.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව මෙම චක්‍රලේඛ ලිපිය නිකුත් කෙරේ .


කේ.ඩී.එන්.රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk